**ප්‍රශ්න පත්‍ර 34**

01. පරිගණකයක කාර්ය සාධනය වැඩි කිරීම සඳහා භාවිතා වන නිහිත මතක ආකාර භාවිතය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ කුමක් ද ?

A. ප්‍රධාන මතකය සිට අනුයාතව නියමිත දත්ත හා උපදේශ L1 නිහිත මතකය වෙත ගනු ලබයි.
B. L1 නිහිත මතකය වෙත නියමිත දත්ත හා උපදේශ L2 නිහිත මතකයේ සිට ලබාගත හැකිය.
C. L3 නිහිත මතකය භාවිතයෙන් සැකුම් වේගය පාලනය කළ හැකිය.

(1). A පමණක් සත්‍යවේ. (2). A හා B සත්‍යවේ. (3). B පමණක් සත්‍යවේ
(4). A,B,C සත්‍යවේ (5). C පමණක් සත්‍යවේ

S.Withanage

02. දත්ත ගබඩා කළ හැකි තැටි තාක්ෂණ සම්බන්ධයෙන් සත්‍ය ප්‍රකාශනය / ප්‍රකාශන වන්නේ කුමක් ද ?
A. DVD-ROM තැටි මත 4.7 GB දත්ත ධාරිතාවයක් ගබඩා කළ හැකිය.
B. CD - RW තැටි භාවිතයෙන් වෙනස් කළ නොහැකි පරිදි 700MB දත්ත ප්‍රමාණයක් ගබඩා කළ හැකිය.
C. Blu - Ray තැටි තුළ 25GB හෝ වැඩි දත්ත ධාරිතාවයක් වුවද ගබඩා කළ හැකිවේ.

(1). A පමණක් සත්‍යවේ. (2). A හා B සත්‍යවේ. (3). B සහ C සත්‍යවේ
(4). A,B,C සත්‍යවේ (5). A හා C පමණක් සත්‍යවේ

03. තොරතුරු තාක්ෂණය භාවිතය සම්බන්ධයෙන් පහත වගන්ති සලකන්න.
A. තොරතුරු පද්ධතියකට අනවසරයෙන් ඇතුළු වීම (Hacking) ප්‍රභල ගැටළුවකි.
B. තොරතුරු පද්ධති අපහරණය (Hacking) නිසා නෛතික මතවාද නිර්මාණය වේ.
C. රචනා චෞරත්වය (Plagiarism) සඳහා තොරතුරු පද්ධති අපහරණය කරයි.

(1). A පමණක් සත්‍යවේ. (2). B පමණක් සත්‍යවේ. (3). B සහ C සත්‍යවේ
(4). A,B,C සත්‍යවේ (5). A හා B පමණක් සත්‍යවේ

04. පහත තාර්කික පරිපථය නිරූපණය කරනු ලබන සත්‍යතා වගුව වන්නේ ,




(1)

| A | B | F |
|---|---|---|
| 0 | 0 | 1 |
| 0 | 1 | 0 |
| 1 | 0 | 0 |
| 1 | 1 | 1 |

(2)

| A | B | F |
|---|---|---|
| 0 | 0 | 1 |
| 0 | 1 | 0 |
| 1 | 0 | 1 |
| 1 | 1 | 0 |

(3)

| A | B | F |
|---|---|---|
| 0 | 0 | 0 |
| 0 | 1 | 1 |
| 1 | 0 | 1 |
| 1 | 1 | 0 |

(4)

| A | B | F |
|---|---|---|
| 0 | 0 | 0 |
| 0 | 1 | 1 |
| 1 | 0 | 0 |
| 1 | 1 | 1 |

(5)

| A | B | F |
|---|---|---|
| 0 | 0 | 1 |
| 0 | 1 | 1 |
| 1 | 0 | 1 |
| 1 | 1 | 0 |

05. 192.168.18.132/29 ලිපින පරාසය ක්‍රියාත්මක වන පරිගණක ජාලයේ උපජාල ලිපිනයන් වන්නේ ?
(1). 192.168.132.0 (2). 192.168.0.0 (3). 192.168.18.0 (4). 192.168.18.128
(5). 192.168.18.132

06. විද්‍යුත් ව්‍යාපාරික පද්ධති සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය / ප්‍රකාශන වන්නේ කුමක් ද ?

A. විද්‍යුත් වාණිජ්‍ය පද්ධතියක ප්‍රධාන කොටසක් වේ.

B. බහුවිධ ව්‍යාපාර ක්‍රියාවලි තනි තොරතුරු පද්ධතියක් මගින් නිරූපණය කරයි.

C. විද්‍යුත් ගෙවීම් සඳහා Paypal තාක්ෂණය භාවිතා කළ හැකිය.

(1). A පමණක් සත්‍යවේ. (2). B පමණක් සත්‍යවේ. (3). B සහ C සත්‍යවේ
(4). A,B,C සත්‍යවේ (5). A හා B පමණක් සත්‍යවේ

07. වෙබ් පිටුවක පෝරමය (form) භාවිතය සම්බන්ධයෙන් පහත ප්‍රකාශය සලකන්න.

A. පෝරමය මගින් එවන දත්ත සැකසීම සඳහා HTML භාෂාව භාවිතා කළ හැකිය.

B. පෝරමය මගින් ලබාගත් දත්ත, එම පිටුව මගින් ම සැකසීම කළ හැකිය.

C. පෝරමය මගින් ලබාගන්නා දත්ත, දත්ත පාදකය වෙත යොමු කළ හැකිය.

ඉහත වගනින්ති අනුව වඩාත් නිවැරදි වන්නේ,

(1). A පමණක් සත්‍යවේ. (2). B පමණක් සත්‍යවේ. (3). B සහ C සත්‍යවේ
(4). A,B,C සත්‍යවේ (5). A හා B පමණක් සත්‍යවේ

S.Withanage

08. පරිශීලක දත්ත දත්ත පණිවිඩ (UDP) නියමාවලිය යොදා ගන්නා දත්ත සම්ප්‍රේෂණයක් / යෙදුමක් වන්නේ කුමක් ද ?

(1). විද්‍යුත් තැපැල (2). වෙබ් පිටු (3). වීඩියෝ සම්ප්‍රේෂණය
(4). පරිගණක ජාල අතර සම්ප්‍රේෂණය (5). ඊ - වාණිජ්‍ය

09. වෙනත් ජාලයක ග්‍රාහක පරිගණකයක් වෙත දත්ත පැකට්ටුවක් යැවීමට මං හැසිරවීමට අවශ්‍යව ඇත. ඒ සඳහා අත්‍යවශ්‍ය වන්නේ,

(1). ග්‍රාහකයාගේ ලිපිනය (2). යවන්නාගේ ලිපිනය (3). IP ලිපිනය
(4). ජාල ලිපිනය (5). දත්ත ගමන් කළ යුතු මාර්ගය

10. විශාල රෝගීන් ප්‍රමාණයක් දිනකට පැමිණෙන රෝහලක රෝගීන් ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා තොරතුරු පද්ධතියක් නිර්මාණය කරන ලදී. මෙම තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා වඩාත් සුදුසු ක්‍රමවේදය වන්නේ,

(1). සමාන්තර ක්‍රියාවට නැංවීම (2). රේඛීය ක්‍රියාවට නැංවීම (3). නියමු ක්‍රියාවට නැංවීම
(4). අවධි ක්‍රියාවට නැංවීම (5). සමාන්තර හෝ රේඛීය ක්‍රියාවට නැංවීම

11. ආයතනයක ප්‍රධාන පරිගණක ජාලය, උපජාල හතරකින් සහ Wi-Fi ජාලයක් සමගින් ක්‍රියාත්මක වේ. සමස්ථ ජාලය තුළ ම පරිගණක හා උපක්‍රම 145 ක් පමණ අඩංගු වේ. ජාලය සඳහා භාවිතා කළ හැකි වඩාත්ම සුදුසු උපජාල ආවරණය (subnet mask) කුමක් ද ?

(1). 255.255.255.224 (2). 255.255.255.0 (3). 255.255.255.128 (4). 255.255.255.192
(5). 255.255.128.0

12. ඇල්ගොරිතමික ප්‍රවේශය සම්බන්ධයෙන් පහත දී ඇති වගන්ති සලකන්න.

A. ඇල්ගොරිතමයක් ගොඩනැගීමට ව්‍යාජ කේත සමග ගැලීම් සටහන් භාවිතා කළ හැක.

B. ක්‍රමලේඛණයක් ගොඩ නැගීමට පෙර ඇල්ගොරිතමයක් ගොඩනැගීම අනිවාර්යය වේ.

C. ඇල්ගොරිතමයක් භාවිතා කර නිර්මාණය කරන ක්‍රමලේඛයක වාග්රීති දෝෂ (syntax error) අවම කරයි.

ඉහත වගනින්ති අනුව වඩාත් නිවැරදි වන්නේ,

(1). A පමණක් සත්‍යවේ. (2). B පමණක් සත්‍යවේ. (3). B සහ C සත්‍යවේ

(4). A,B,C සත්‍යවේ (5). A හා C පමණක් සත්‍යවේ

13. මුදල් නොට්ටු ගණනය කළ හැකි පද්ධතියක කාර්යය බද්ධ නොවන අවශ්‍යතාවයක් වන්නේ කුමක් ද ?
   (1). හානි වී ගිය මුදල් නොට්ටු හඳුනා ගත හැකි විය යුතුය.
   (2). ව්‍යාජ මුදල් නොට්ටු අඩංගු වීම හඳුනාගත යුතුය.
   (3). මුදල් මත වචන ලිවීම හෝ විකෘති කළ මුදල් නොට්ටු හඳුනා ගත යුතුය.
   (4). යන්ත්‍රය මගින් ගණන් කළ මුදල් නොට්ටුවල වටිනාකම වෙනස් කිරීමට නොහැකි විය යුතුය.
   (5). පළුදු වී තිබෙන නොට්ටු ගණනය කිරීමට ඇතුළත් නොකට ඉවත් කළ යුතුය.

14. ස්වයංක්‍රීයව දත්ත ආදානය කිරීමේ ක්‍රම සම්බන්ධයෙන් නිවැරදි වන්නේ කුමක් ද ?
   A. වෙබ් පාදක පද්ධතියක් සඳහා නියෝජිත මෘදුකාංග තාක්‍ෂණය භාවිතා කිරීමේ හැකියාව පවතී.
   B. ගණුදෙනු සැකසුම් පද්තියක් ක්‍ෂණික ප්‍රතිචාර කේත (QR) භාවිතා කරයි.
   C. මිල ගණන් ඇතුළත් කිරීම සඳහා තීරු කේත (Bar Code) භාවිතා කරයි.

   ඉහත වගන්ති අනුව වඩාත් නිවැරදි වන්නේ,

   (1). A සහ B නිවැරදි වේ. (2). A සහ B පමණක් සත්‍යවේ. (3). B සහ C සත්‍යවේ
   (4). A,B,C සත්‍යවේ (5). A හා C පමණක් සත්‍යවේ

15. පාසලක ගුරුවරුන් නිවාඩු ලබාගැනීම සම්බන්ධයෙන් දත්ත සටහන් කරන වගු ආකෘතිය සලකන්න.
   Leave(teacherID, date,name,grade,startdate,enddate,description,noofdays)
   මෙම වගුව පවතින ප්‍රමත අවස්ථාව වන්නේ කුමක් ද ?

   (1). ශුන්‍ය ප්‍රමත අවස්ථාව (2). පළමු ප්‍රමත අවස්ථාව (3). දෙවන ප්‍රමත අවස්ථාව
   (4). තෙවන ප්‍රමත අවස්ථාව (5). ප්‍රමත අවස්ථාව තීරණය කළ නොහැක.

16. දත්ත ඒකාබද්ධාතව අනුව අසත්‍ය ප්‍රකාශය කුමක් ද ?
   (1). භූථාර්ථ / වස්තු ඒකාබද්ධතාව මගින් වගුවක ව්‍යුහය විස්තර කරයි.
   (2). වසම් ඒකාබද්ධාතව මගින් වගුවක තීරු පැවතිය යුතු ලක්‍ෂණ / ගුණාංග විස්තර කරයි.
   (3). යොමු ඒකාබද්ධතාව මගින් වගු දෙකක් අතර ප්‍රාථමික යතුරු හා ආගන්තුක යතුර අඩංගු වීම විස්තර කරයි.
   (4). වගු පැවතිය යුතු සම්මත තත්ත්වය දත්ත ඒකාබද්ධතාව මගින් විස්තර කරයි.
   (5). වගු ප්‍රමිතියක් යටතේ සකස් කිරීම මෙම මූලික තත්ත්ව යටතේ විස්තර කරයි.

17. ගණුදෙනු සැකසුම් පද්ධතියක පවතින ලක්‍ෂණයක් නොවන්නේ කුමක් ද ?
   (1). ආයතනයක මෙහෙයුම් මට්ටමේ භාවිතා වේ.
   (2). පාරිභෝගිකයින් / ගණුදෙනුකරුවන්ගේ දත්ත ඒකරාශි වීමක් සිදුවේ.
   (3). කළමනාකරන තොරතුරු පද්ධති වෙත දත්ත සැපයීම සිදුවේ.
   (4). ගණුදෙනුවක නිරවද්‍යතාවය තහවුරු කරයි.
   (5). ඍජුදත්ත ආදානයන් භාවිතා කළ නොහැක.

18. පයිතන් ක්‍රමලේඛ භාෂාව සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය නොවන්නේ කුමක් ද ?
   (1). සරල වාග් රීති රටාවක් පවතින භාෂාවක් වේ.
   (2). විවෘත මූලාශ සහිත ක්‍රමලේඛ භාෂාවක් බැවින් නොමිලේ අන්තර්ජාලයෙන් ලබාගත හැකිය.
   (3). පවිතන් වැඩසටහන් ඕනෑම මෙහෙයුම් පද්ධතියක්, හෝ සන්නිවේදන උපාංගයක මත ක්‍රියාත්මක කළ හැකිය.
   (4). වස්තු නැඹුරු ලක්‍ෂණය පවතින ක්‍රමලේඛ භාෂාවකි. ජංගම තොරතුරු පද්ධති සකස් කිරීමට වඩාත් සුදුසු වේ.
   (5). නැවත නැවත ක්‍රියාත්මක කිරීමේ දී, වේගවත් ව ක්‍රියාත්මක වෙමින් ප්‍රතිදානය ලබාදේ.

S.Withanage

19. අතත්‍ය මතක කළමනාකරණය භාවිතය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය / ප්‍රකාශන කුමක් වේද ?

A. අතත්‍ය මතකය භාවිතය මගින් පරිගණකයක සැකසුම් ක්‍රියාත්මක වීම වේගවත් කළ හැකිය.

B. ප්‍රධාන මතකය අවහිර වීම අතත්‍ය මතකය භාවිතය අනුව අවම කළ හැකිය.

C. සැකසුම් වැඩි ප්‍රමාණයක් සැකසීම සඳහා පවතින වට්ට අතත්‍ය මතකය භාවිතය ඉහළ වේ.

ඉහත වගනින්ති අනුව වඩාත් නිවැරදි වන්නේ,

(1). A සත්‍යවේ. (2). A සහ B පමණක් සත්‍යවේ. (3). C සත්‍යවේ
(4). A,B,C සත්‍යවේ (5). B හා C පමණක් සත්‍යවේ

20. මෙහෙයුම් පද්ධතියක අඩංගුවන ක්‍රියාවලික් නොවන්නේ කුමක් ද ?
(1). අතත්‍ය මතක කළමනාකරණය (2). පද්ධතියක ආරක්ෂාව සැපයීම.
(3). සැකසුම් නියමකරණය (4). ආදානය කළ දත්ත සැකසීම.
(5). පරිශීලක සමග සම්බන්ධ වීම.

21. ආංකිත සංඥාවක් ප්‍රතිසම සංඥාවක් බවට පත්කිරීම සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශයක් වන්නේ කුමක් ද ?
(1). සංඛ්‍යාත සිරුමාරු කිරීම අනුව වෙනස් විස්තාරය මට්ටම් අනුව ප්‍රතිසම සංඥාව නිර්මාණය කරයි.
(2). කලා මූර්ජනය අනුව සංඥාවේ හැඩය වෙනස් නොකර ප්‍රතිසම සංඥාව සකස් කරයි.
(3). විස්තාර සීරු මාරුව අනුව සංඛ්‍යාත මට්ටම් දෙකක් සමගින් ආංකිත සංඛ්‍යාව නිර්මාණය කරයි.
(4). වෙනස් විස්තාරයන් ගනනාවක් පවතින පරිදි වාහක තරංගයක් භාවිතයෙන් ප්‍රතිසම සංඥා නිර්මාණය කළ හැක.
(5). සංඛ්‍යා මට්ටම් දෙකක් පමණක් පවතින පරිදි ප්‍රතිසම සංඥාව සකස් කරයි.

22. ටෙලිකොමිනිය (Telecommuting) අනුව කළ නොහැකි ක්‍රියාවලිය වන්නේ කුමක් ද ?
(1). පරිගණකයක (IP) ලිපින ඇතුල් කිරීම (2). තොරතුරු පද්ධතියක දෝෂ පරීක්ෂා කිරීම.
(3). දත්ත පාදකයක් සකස් කිරීම (4). වෙබ් සේවා අනුග්‍රාහකයේ දෝෂ නිවැරදි කිරීම.
(5). තොරතුරු පද්ධතියක දක්නට ලැබෙන ලිපියක් අනුමත කිරීම.

23. /26 CIDR අගය අනුව උපජාල ආවරණය වන්නේ කුමක් ද ?
(1). 255.255.255.128 (2). 255.255.255.192 (3). 255.255.192.0
(4). 255.255.255.255 (5). 255.255.255.3

24. පයිතන් ක්‍රමලේඛ තුළ ක්‍රියාපරිපාටි (Function) භාවිතයේ වාසියක් වන්නේ කුමක් ද ?

(1). උපදෙස් කාණ්ඩ නැවත නැවත අඩංගු කිරීම වැලක් වීම.
(2). සංකීර්ණ ක්‍රියාවලියක් සරල කොටස් බවට පත් කිරීමේ හැකියාව.
(3). කේත කාණ්ඩ නැවත භාවිතය
(4). ක්‍රියාවලියක් සිදුවන උපදෙස් පරිශීලකයාගෙන් සැගවීම.
(5). ඉහත සියල්ලම නිවැරදි වේ.

S.Withanage